# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2022

### 2024 දෙසැම්බර්/ 2025 ජනවාරි

### සමාජීය විද්‍යා පීඨය

## ආර්ථික විද්‍යාව

### (නව නිර්දේශය)

## සූක්ෂම ආර්ථික විද්‍යාව - ECON 28214

<u>පළමු ප්‍රශ්නය ඇතුළුව</u> ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. i. සාර්ව ආර්ථික විද්‍යාව සහ සූක්ෂම ආර්ථික විද්‍යාව අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 04)

ii. සංඛ්‍යාංක උපයෝගිතා සංකල්පය සහ ක්‍රමාංක උපයෝගිතා සංකල්පය සංසන්දනය කරන්න. (ලකුණු 04)

iii. ආන්තික ආදේශන අනුපාතය (MRS) සහ ආන්තික තාක්ෂණික ආදේශන අනුපාතය (MRTS) අතර වෙනස රූප සටහන් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

iv. කතිපයාධිකාරී වෙළෙඳපොළ සහ ඒකාධිකාරී තරඟකාරී වෙළෙඳපොළ අතර සමාන අසමානකම් පැහැදිලි කරන්න. (ලකුණු 04)

v. කෙටිකාලීන මුළු පිරිවැය, සාමාන්‍ය පිරිවැය සහ ආන්තික පිරිවැය රූප සටහන් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

02. ආර්ථික විද්‍යාව සම්බන්ධයෙන් පොදුවේ පිළිගත් එක් නිර්වචනයක් නොමැති අතර විවිධ ආර්ථික විද්‍යාඥයින් අර්ථ දැක්වීම් රාශියක් ඉදිරිපත් කර තිබේ. මෙම අර්ථ දැක්වීම් පදනම් කරගෙන ආර්ථික විද්‍යාවේ ආරම්භය සහ විකාශය පිළිබඳ සාකච්ඡා කරන්න. (ලකුණු 20)

03. i. මුළු උපයෝගිතාව සහ ආන්තික උපයෝගිතාව රූපසටහන් ආශ්‍රයෙන් පැහැදිලි කර, හීනවන ආන්තික උපයෝගිතා සංකල්පය විස්තර කරන්න. (ලකුණු 10)

ii. ආන්තික උපයෝගිතා න්‍යාය හඳුන්වා, එහි භාවිත උපකල්පන සහ පරිභෝජක සමතුලිතය පිළිබඳ සාකච්ඡා කරන්න. (ලකුණු 10)

04. i. උදාසීනතා වක්‍රය නිර්වචනය කර, උදාසීනතා වක්‍රවල ගති ලක්ෂණ රූප සටහන් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

ii. උදාසීනතා වක්‍ර විග්‍රහයේ භාවිත උපකල්පන විස්තර කරන්න. (ලකුණු 06)

iii. භාණ්ඩයක මිල වෙනස්වීමේ මුළු ප්‍රතිවිපාකය, ආදායම් ප්‍රතිවිපාකය සහ ආදේශන ප්‍රතිවිපාකය ලෙස වෙන් කරන ආකාරය රූප සටහන් ඇසුරින් විග්‍රහ කරන්න. (ලකුණු 10)

05. i. හීනවන ආන්තික ඵලදා නීතිය හඳුන්වා එම නීතියට අනුව කෙටිකාලීන මුළු ඵලදාව, සාමාන්‍ය ඵලදාව සහ ආන්තික ඵලදාව හැසිරෙන ආකාරය කල්පිත උදාහරණයක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

ii. "දිගුකාලීන නිෂ්පාදන ශ්‍රිතයක හැසිරීම විග්‍රහ කරනුයේ පරිමාණානුකූල ඵල පිළිබඳ නියමය මත පදනම්ව වේ." විමසන්න. (ලකුණු 10)

06. i. ප්‍රධාන වෙළෙඳපොළ ආකෘති හතර හඳුන්වා ඒවා එකිනෙකින් වෙනස් වන ආකාරය මූලික ලක්ෂණ පදනම් කරගෙන සාකච්ඡා කරන්න. (ලකුණු 10)

ii. පූර්ණ තරඟකාරී වෙළෙඳපොළක කෙටිකාලීන සහ දිගුකාලීන සමතුලිතය රූපසටහන් භාවිතයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

07. i. කතිපයාධිකාරී වෙළෙඳපොළක මිල දැඩියාවක් පවතින්නේ ඇයි දැයි රූප සටහන් භාවිතයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

ii. ඒකාධිකාරී තරඟ වෙළෙඳපොළක සහ කතිපයාධිකාරී වෙළෙඳපොළක කෙටිකාලීන සහ දිගුකාලීන සමතුලිතය වෙන වෙනම රූප සටහන් භාවිතයෙන් පැහැදිලි කර, සමාන අසමානකම් පෙන්වා දෙන්න. (ලකුණු 10)

08. ඕනෑම මාතෘකා හතරක් (04) පිළිබඳ කෙටි සටහන් ලියන්න.

i. ප්‍රත්‍යක්ෂ වරණ න්‍යාය
ii. ආදායම් පරිභෝජන වක්‍රය සහ මිල පරිභෝජන වක්‍රය
iii. දිගුකාලීන සාමාන්‍ය පිරිවැය වක්‍රය
iv. බදු කුලිය සහ ආර්ථික බදු කුලිය
v. මිල විශේෂණය

(ලකුණු 05 බැගින්)

*******************************